දැරණියගල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 13,137,875 ක් වුවද, උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව රු.7,443,531ක් වූයෙන් රු. 5,694,344 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන සහ උපයෝගී ලේඛන සැසඳීම සිදු කර වෙනස්කම් නිවැරදි කළ යුතුය. | පසුගිය කාලයට අදාල අත්තිකාරම් පිළිබඳව නිශ්චිත තොරතුරු සොයා ගැනීම දුෂ්කර බැවින් ඒ පිළිබඳව කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බවත්, අනෙකුත් ශේෂ සම්බන්ධයෙන් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ස්ථාවර වත්කම් හා තොගවල එකතු වටිනාකම සහ මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම අතර රු. 15,791,480 ක වෙනසක් පැවතුණි. | සැසඳීම් සිදුකර කරුණු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. | භාණ්ඩ සමීක්ෂණ වාර්ථාවේ ස්ථාවර වත්කම් හා තොග එකතු වටිනාකමත්, මූල්‍ය ප්‍රකාශන වල වටිනාකමත් අතර වෙනස පිළිබඳ කරුණු සොයා බලා කටයුතු කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය | සභා බල ප්‍රදේශයේ සම්ප්‍රේෂණ කුළුණු 10 ක් පැවතියද, ඒ සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කොට බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු. 30,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී, එකී දුරකථන සමාගම් මගින් ව්‍යාපාර බදු අයකරගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 08 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2020 වසරේදී ප්‍රාදේශීය සභාව සතු සියලු වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,683,358 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,971,495 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් ,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I | වරිපනම් හා බදු | 7,655,840 | 8,504 ,166 | 6,533,205 | 1,970,962 | 7,877,420 | 8,957,752 | 6,913,454 | 2,044,297 |
| Ii | කුලී | 5,799,350 | 7,617,831 | 7,605,243 | 12,588 | 4,709,850 | 5,998,306 | 5,983,777 | 14,530 |
| Iii | බලපත්‍ර ගාස්තු | 720,100 | 833,028 | 833,028 | - | 647,100 | 753,092 | 753,092 | - |
| Iv | වෙනත් ආදායම් | 154,877,700 | 112,085,824 | 65,292,214 | 46,793,610 | 121,404,880 | 82,909,449 | 37,043,770 | 45,865,679 |

### 2.2.2 ප්‍රචාරක දැන්වීම් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති ස්ථිර සහ තාවකාලික දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණයක් සිදුකර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සමීක්ෂණයක් සිදු කර ස්ථිර දැන්වීම් පුවරු වලට අදාලව ගාස්තු අයකර ගැනීමට මේ වන විට කටයුතු කර ඇති බව දන්වමි. |

### 2.2.3 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා ජල පාරිභෝගිකයන් 45 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.44,055 ක් අයකරගෙන නොතිබුණු අතර ඉන් රු.30,437 ක් ජල සම්බන්ධතා විසන්ධිකොට තිබුණු අයගෙන් අයවිය යුතු මුදල් විය. | සභාවට අයවිය යුතු ආදායම් නිසි වේලාවට රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. | විසන්ධි කරන ලද ජල සම්බන්ධතා සඳහා මුදල් ගෙවන ලෙස එම පාරිභෝගිකයන් වෙත ලිපි යොමු කර ඇති බව දන්වමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,043,781 ක් හා මුද්දර ගාස්තු රු. 6,950,118 ක් විය. එසේම වර්ෂයක කාලයක් ඉක්ම වූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 2,543,781 ක් හා රු. 1,322,450 ක් විය. | ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. | ලැබිය යුතු උසාවි දඩ මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

## (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2001 ජුනි 26 දින පැවති මහා සභාවේ දී සම්මත වූ යෝජනාවක් පරිදි 2001 ජූලි 27 දිනැති ගැසට් පත්‍රයෙහි පළකරන ලද දැන්වීම පරිදි අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළාත් පාලන ඇමතිවරයා විසින් ප්‍රසිද්ධ කර තිබුණු කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 42 ක් පිළිගෙන තිබුණු නමුත් ඇතැම් අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ප්‍රචාරන දැන්වීම් පළ කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවක් නැවත කෙටුම්පත් කර තිබුණද එය සම්මත කර නොතිබුණු අතර සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව ද කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට හා නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ දැනට කෙටුම්පත් කර ඇති අතුරු ව්‍යවස්ථාව අවශ්‍ය සංශෝධනයන් සිදු කර සම්මත කර ගැනීමට කටයුතු කරන බවත් එතෙක් පළාත් පාලන ඇමැතිවරයා විසින් ප්‍රසිද්ධ කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 42 හි වන ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන බවත් දන්වමි. |

## (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පොහොර නිෂ්පාදනය, අලෙවිය සහ කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීම හා ගෘහස්ථ ප්‍රතිචක්‍රීය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත ඉලක්කයන් ලගා කර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ගෘහස්ථ කොම්පෝස්ට් නිෂ්පාදනය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණය පිළිබඳ වැඩසටහනක් සිදු කිරීමට අපේක්ෂිත බව දන්වමි. |

## (ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දැරණියගල බස්නැවතුම්පල ආශ්‍රිතව දෙමහල් පොදු වෙළඳ සංකීර්ණයේ පලමු මහල ඉදිකිරීමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා පෙර ගෙවුම් මුදල් (Key Money) ලෙස බදුකරුවන් 29 දෙනෙකුගෙන් රු. 24,299,000 ක් 2015 වර්ෂයේදී ලබාගෙන තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2017 අගෝස්තු 12 දින වනවිට අදාල කඩකාමර | ගිවිසුමට අනුව ඉදිකිරිම් කඩිනමින් නිමකර අරමුණු ඉටුකර ගත යුතුය. | ගිවිසුම්ගත කාලය දීර්ඝ නොකලද කඩකාමර ඉදිකර අවසන් වූ වහාම බදු කරුවන් වෙත එම කඩ කාමර ලබා දීමට කටයුතු කර බව දන්වමි. |

බදුකරුවන් වෙත ලබා දීමට නියමිත වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිමකර නොතිබුණි.

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල දෛනිකව කැලි කසළ ටොන් 2 ක් රැස් වුවද, විධිමත් කසළ කළමනාකරණ වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ප්‍රදේශයේ එක් රැස්වන කැලි කසළ අක්‍රමවත්ව බැහැර කිරීම නිසා වර්ෂා කාලයේදී කැලි කසළ, කෘමිනාශක, අනෙකුත් රසායන ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ගංගා ජලයට එකතුවන බැවින් පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ සභාවේ වගකීම් ප්‍රමාණවත් පරිදි ඉටු වී නොතිබුණි. | පරිසරය ආරක්ෂා වන අයුරින් කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කල යුතුය. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ කටයුතු සිදුකරන අවස්ථාවේ ඒ සඳහා මහජන විරෝධතා ඇතිවීම හේතුවෙන් සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙහි කොටසක ජීව වායු ඒකකයක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

**(ඉ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොළ භූමියෙහි හා බස්නැවතුම් පොලෙහි පිහිටි පොදු වැසිකිළිවලින් ඉවත්කරන ගලි අපද්‍රව්‍ය සහා ගොඩනැගිල්ල පිටුපස ක්‍රීඩාංගනය කෙලවර වලවල් කපා බැහැර කර පස්දමා තිබුණු අතර, එම වළවල්වල ජලය රැඳී තිබුණි. එමගින් මදුරුවන් බෝවී ඩෙංගු රෝගය පැතිරීමේ අවදානමක් පැවති අතර එම ස්ථානය දළ බැවුමක් සහිතව පිහිටා තිබීම නිසා නායයාමේ අවදානමක් ද පැවතුනි. | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පරිසර හිතකාමී විධිමත් වැඩපිළිවෙලක් සකස්කළ යුතුය. | යෝජිත ජීව වායු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය හරහා ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට විසඳුම් ලබා දීමට අපේක්ෂා කරන බව දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු 19 ක් පැවතුණි. එම පුරප්පාඩු අතරින් ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරක් , කාර්මික නිලධාරි | අත්‍යාවශ්‍ය පුරප්පාඩු අප්‍රමාදව සම්පූර්ණ කර | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාල තොරතුරු ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්, පුරප්පාඩු පැවතීම |

| | | |
|---|---|---|
| තනතුරක්, සංවර්ධන නිලධාරි තනතුරු 03 ක් හා කළමනාකරණ සේවා නිළධාරි තනතුරු 4 ක් පුරප්පාඩුව පැවතීම සභාවේ කාර්යසාධනය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකර තිබුණි. | ගැනීමට කටයුතු කළ යුතුවේ. | හේතුවෙන් දැනට සේවයේ නියුතු නිලධාරින්හට පැවරී ඇති රාජකාරි ප්‍රමාණය විශාල වන බැවින් රාජකාරි වල උපරිම ඵලදායිතාවය ලබාගැනීමට නොහැකි වී ඇති බවත් දන්වමි. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 පවරා නොගත් වත්කම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලසීමාව තුළ සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබුණ ට්‍රැක්ටර් 04 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් සභාවට අයත් ට්‍රැක්ටර් හා ටේලර් ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.3.2 **වාහන උපයෝජනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබුණු රු. 250,000 ක් වටිනාකමැති අත්ට්‍රැක්ටරය අපහරණය කර නොතිබුණි. | අපහරණය සඳහා පියවර ගත යුතුය. | අදාල මිල ගනන් හා තත්ව වාර්තා නැවත ලබා ගෙන වෙන්දේසි කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ගම් පෙරලිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ වූ ඉලුක්තැන්න පහල කොටසේ කෝවිල ඉහල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය භෞතික පරීක්ෂාවේදී ලබාගන්නා ලද මිණුම්, ගෙවීම් වාර්තාව සමඟ සැසඳීමේදී කොන්ක්‍රීට් කියුබ් 2.8 ක් සඳහා රු. 135,168 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. | වැඩිපුර ගෙවා ඇති මුදල වන රු. 135,618 අදාල කර්මාන්තයේ රැඳවුම් මුදලින් හා කොන්ත්‍රාත්කරු වන සී/ස දැරණියගල පනාවල විවිධ සේවා සමූපකාර සමිතියෙන් නැවත අයකරගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 30 ක් වූ ඉඩම් කොටස් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. | ඉඩම් පරීක්ෂා කර බලා වත්මන් මිල ගණන් වලට අනුව තක්සේරු කර වටිනාකම ලබා දීමටත් ගිණුම් ගත කිරීමටත් කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින රු.68,600 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිරවුල් කර ගැනීමට කටයුතුකළ යුතුය. | පැරණි වර්ෂයක හිඟ මුදලක් නිසා බොහෝ ව්‍යාපාරිකයින් ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කිරීමක් සිදුකරන බැවින් අයකර ගැනීම අපහසුවී ඇත. . |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා වැව්ලි සමාගමක් සතු හෙක්ටයාර් 2 පර්චස් 35.37 ක ඉඩම් කොටසක් අත්පත් කරගැනීමේ මූලික කටයුතු සඳහා 2018 ජූලි 25 දින රු. 155,000 ක් දැරණියගල ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණි. 2019 මැයි 30 දින තෙක් මෙම කාර්යය ඉදිරියට එමින් පැවතුණද, පසුව මහජන විරෝධතා එල්ලවී තිබුණු අතර, ඒ සඳහා විකල්ප ඉඩම් පිළිබඳව පරීක්ෂා කරමින් පවතින බව නිරීක්ෂණය විය. | ඝන අපද්‍රව්‍ය කළමනාකර ව්‍යාපෘතියට අදාලව ඉඩම් පවරාගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | ඉඩම අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින බව දන්වමි. |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශය තුල බෙදාහරින ජලය විධිමත් පිරිපහදු කිරීමේ ක්‍රමයකින් තොරව සැපයෙන බැවින් දිගු කලක සිට ජල සම්පාදන මණ්ඩලය ඇතුළු ආයතන වලින් ප්‍රමාණවත් ජල සම්පාදන ක්‍රමයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණි. ලෝක බැංකු ආධාර මත 2016 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක කෑගල්ල දිස්ත්‍රික් ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල පිරිපහදු පද්ධතියක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණද මේ දක්වා ස්ථානයක් හඳුනාගැනීම, මිණුම් කටයුතු සිදු කිරීම හා ඉඩම අත්පත්කර ගැනීමේ මූලික කටයුතු පමණක් සිදුකර තිබුණි. | කාර්යක්ෂමව ජල ව්‍යාපෘතියේ කටයුතු සිදුකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම් කොටස අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |